023

සියලුම හිමිකම් ඇවිරිණි
මුළුමු ප්‍රකාශන හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 9 - ශ්‍රේණිය

## නර්තනය

නම/විභාග අංකය :- ............................................................................ කාලය: පැය 02යි.

## I කොටස

- අංක 01 සිට 20 තෙක් සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) සරඹ අභ්‍යාස කිරීමේ දී පිළිවෙළින් ........................ ලයට අභ්‍යාස කරනු ලබයි.

(1) විලම්භ , මධ්‍ය , දෘත (2) විලම්භ , දෘත , මධ්‍ය

(3) අතිවිලම්භ , මධ්‍ය , දෘත (4) විලම්භ , මධ්‍ය , අතිදෘත

(02) කාලය මැනීමේ කුඩා ම ඒකකය,

(1) රිද්මයයි. (2) ලයයි.

(3) මාත්‍රාවයි. (4) තිතයි.

(03) බෙර වාදනයට දැත හුරුකර ගැනීමේ දී මුලින් ම කළ යුත්තේ ............................ වාදනය කිරීමයි.

(1) ගර්භාක්ෂර (2) බෙර පද

(3) අලංකාර පද (4) පසර බීජාක්ෂර

(04) දේශීය වන්නම් නර්තනයේ දී පද නර්තනයට යොදා ගනු ලබන්නේ,

(1) තාලානුකූල චලනයයි. (2) ප්‍රකාශනාත්මක චලනයයි.

(3) අභිචලනයි. (4) රිද්මයානුකූල චලනයි.

(05) ජීවිතයේ එදිනෙදා අවශ්‍යා සිද්ධි සැබෑ ස්වරූපයෙන් බැහැරව අතිශයෝක්තියෙන් වර්ණනා කරන නාට්‍ය ........................................ වේ.

(1) ගීත නාට්‍ය (2) මුද්‍රා නාට්‍ය

(3) ශෛලිගත (4) තාත්ත්වික නාට්‍ය

(06) මාත්‍රා 3 + 4 දෙකිතේ තාල රූපයට අයත් මාත්‍රා ගණන වන්නේ,

(1) 7කි. (2) 8කි. (3) 10කි. (4) 11කි.

(07) ශ්‍රී ලංකාවේ ජන ජීවිතය හා බැඳි වෘත්තීන් සම්බන්ධව නිර්මාණය වී ඇති ගැමි නැටුම් 2කි.

(1) චාමර , කුඩු (2) කළගෙඩි, පතුරු

(3) ගොයම් , පන් (4) කුළු , චාමර

(08) සත්ත්ව චරිතයක් නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීමට

(1) වැඩි කාලයක් සරඹ අභ්‍යාස කළ යුතුවේ.

(2) ස්වාභාවික පරිසරය නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් වැදගත් වේ.

(3) තාලානුකූල චලන පමණක් යොදා ගත යුතු වේ.

(4) රිද්මයානුකූල චලන පමණක් යොදා ගත යුතුවේ.

(09) ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දෙසීන පද සංඛ්‍යාවෙන්

(1) 8කි. (2) 10කි. (3) 12කි. (4) 14කි.

(10) දුර්ගා දේවිය, ලක්ෂ්මී දේවිය හා සරස්වතී දේවිය ප්‍රධාන කොටගෙන ................................ උත්සවය පැවැත්වේ.

(1) තෛපොංගල් (2) තත්කල් (3) රාමසාන් (4) නවරාත්‍රී

(11) ක්‍රීඩාව, සංගීතය, ඉගෙනීම ශාරීරික මෙන් ම මානසික සුවයට බලපාන බව පවසා ඇත්තේ කුමන දාර්ශනිකයා ද?

(1) ප්ලේටෝ (2) බලුම් (3) අයින්ස්ටයින් (4) ගැලීලියෝ


(12) පිදවි මුණිඳු වැඩහිඳ බෝමුල විදුරාසන..... යන කවිය,


(1) මල්යහන් කවියකි. (2) සිරපපාද කවියකි. (3) තවතුරා කවියකි. (4) ගුණපංති කවියකි.

- පහත රූප සටහන් ඇසුරෙන් 13 - 15 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B


C


D

(13) ගොයම් නැටුම සඳහා යොදාගනු ලබන සුවිශේෂ වාද්‍ය භාණ්ඩය දක්වෙන්නේ,

(1) A රූපයේ ය. (2) B රූපයේ ය. (3) C රූපයේ ය. (4) D රූපයේ ය.

(14) පොකුරු බෙරය නමින් හැඳින්වෙන වාද්‍ය භාණ්ඩය ඇතුළත් අක්ෂරය දක්වෙන්නේ,

(1) B රූපයේ ය. (2) C රූපයේ ය. (3) A රූපයේ ය. (4) D රූපයේ ය.

- අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා හරි නම් (✓) ලකුණ ද වැරදිනම් (✗) ලකුණ ද යොදන්න.

(16) ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණය කිරීම සඳහා තල, දිසා රටා සහ අවකාශය භාවිතය වැදගත් වේ. ( )

(17) සත්පත්තිනි, ශුභ අවලය යන මුද්‍රා නාට්‍ය A ඉබුල්ගොඩ මහතා විසින් නිර්මාණය කර ඇත. ( )

(18) භරත නාට්‍ය ප්‍රවර්ධනයසඳහා තන්ජාවූර් සහෝදරයින් දායක වී නැත. ( )

(19) දෙවොල් මඩුව හා පහන් මඩුව යන ශාන්ති කර්මවල පුරාවෘත්ත කථාව හා සේරමාන් රජු සම්බන්ධ වේ. ( )

(20) විධිමත්ව නොපැවති පහතරට නර්තනයේ හස්ත පාද ක්‍රමවත්ව ගොඩනැගීම විල්සන් බලමොටුව මහතාගෙන් සිදු වූ එක් සේවාවකි. ( )

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (1) ශෝකය නමැති ස්ථායි භාවයෙන් ........................................ රසය උපදී.

(2) උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායේ දී ........................................ නමින් හඳුන්වයි.

(3) ශාන්ති දේවි සෝන් නිෂ්පාදනය කළ ........................................ මුද්‍රා නාට්‍ය ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රා නාට්‍ය වේ.

(4) විල්සන් බලබොඩුව මහතා ........................................ නර්තන සම්ප්‍රදායේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියෙකි.

(5) "නටන ගහපතියා විසින් පවරා දෙන ලදී." යනුවෙන් ........................................ සෙල්ලිපියේ සඳහන් වේ.

(6) අතීතයේ අණ බෙර වාදන සඳහා ........................................ භාවිත කොට ඇත.

(7) ........................................ වන්නම මාත්‍රා 3 තනිතිතට නටනු ලැබේ.

(8) "රන්වන් දුන් කරලින් පැසිලා" යන ගීතයට සංගීතය නිර්මාණය කරන ලද්දේ ........................................ මහතා ය.

(9) පහතරට දෙවොල් මඩු ශාන්ති කර්මයේ දී ........................................ දෙවියන් ප්‍රධානව පුද ලබන අතර, කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ දී ........................................ දෙවියන් ප්‍රධානව පුදනු ලැබේ.

(10) ස්වස්ථතාවය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක නම්,

1. ........................................ 2. ........................................

(1 - 8 = 08 / 9 - 10 = 04) ලකුණු 1 × 12 = 12

(02) චරිත නිර්මාණය කිරීමේ ප්‍රධාන මාධ්‍ය නර්තනයයි. මිනිස් චරිත නිර්මාණය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| මිනිස් චරිතය | චරිතවල සුවිශේෂ ලක්ෂණ | භාවිතයට ගන්නා උපකරණ |
|---|---|---|
| 1. | 3.<br>4. | 7.<br>8. |
| 2. | 5.<br>6. | 9.<br>10. |

1 - 2 ලකුණු 2 × 2 = 4
3 - 10 ලකුණු 1 × 8 = 8
(මුළු ලකුණු 12)

(03) (1) සිංහරාජ වන්නම / අනුරාගදණ්ඩ තාලය / විරාඩි වන්නමේ බෙර පදය හා කවි පද දෙකක් ප්‍රස්ථාරගත කරන්න.

(2) මාත්‍රා 3 තනිතිතට අදාළව සක්බිරම / ඉරට්ටිය / කලාසම ලියන්න. (ලකුණු 12)

(04)



A



B

(1) A හා B නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

(2) B රූපයේ දක්වෙන නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශය හා සංගීත සම්ප්‍රදාය නම් කරන්න.

(3) B නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංග හතරක් නම් කරන්න.

(4) B නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 12)

(05)(1) වාදනය කරන ආකාරය අනුව වාද්‍ය භාණ්ඩ වර්ග කර දක්වන්න.

(2) එම වාද්‍ය භාණ්ඩ වාදනය කරන අවස්ථා නම් කරන්න.

(3) ගැටබෙරයේ රූප සටහනක් ඇඳ එහි කොටස් 5ක් නම් කරන්න. (ලකුණු 12)

(06)"මානසික හෝ කායික සුබසිද්ධිය අරමුණු කොට සෙතක් ශාන්තියක් අපේක්ෂාවෙන් ශාන්ති කර්ම පවත්වනු ලබයි.'

(1) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අයත් ශාන්ති කර්ම නම් කරන්න.

(2) ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මය පැවැත්වීමේ අතීත හේතුව හා වර්තමාන හේතු 2ක් ලියන්න.

(3) ශාන්ති කර්ම සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍ය හා පැරසිලි පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 12)